**ශීර්ෂය 264 - යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

-------------------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 21 දින ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජූලි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේදයට යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 1.6.1 (ඇ)(ii) | කරෛයිනගර් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල රු.මිලියන 58ක් වැයකර පුද්ගලික ඉඩමක ඉදිකර තිබුණි. මෙම ඉඩමේ වටිනාකම රු. මිලියන 02ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණ ද, 2020 ජූනි 30 දින දක්වාම එම ඉඩමේ අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු කිරීම. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වලිකාමම් උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල රු.56,023,874ක් වැයකර අන්සතු ඉඩමක ඉදිකර තිබුණි. එහි අයිතිය පවරා ගැනීමට 2021 මාර්තු 31 දින දක්වා කටයුතු කර නොතිබුණු අතර ඉඩමේ වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හෙළිදරව් කර නොතිබුණි. | ලබා දී ඇති පිළිතුරු නිරීක්ෂණයට අදාළ නොවේ. | ඉඩමෙහි වටිනාකම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හෙළිදරව් කිරීම හා ඉඩමේ අයිතිය පවරා ගැනීම. |
| (ආ) | වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් ඉඩමේ වටිනාකම, තක්සේරු කළ වටිනාකමට වඩා රු. 31,500,000ක් අඩුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි. | දත්ත ඇතුළත් කිරීමේදි සිදු වූ දෝෂයකි. පසුව නිවැරදි කර ඇත. | දත්ත ඇතුළත් කිරීමේදී දෝෂ වැළැක්වෙන පරිදි කටයුතු කිරීම. |

## 1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

පහත සඳහන් ඇතැම් ලේඛන පවත්වා ගෙන නොමැති අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා ගෙන නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණයේදී හෙළිදරව් විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් සහ සේවකයින්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | පවත්වා ගෙන යනු ලැබේ. | මුදල් රෙගුලාසි 891(1) හි සඳහන් තොරතුරු ඇතුළත් වන ආකාරයට ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳව ඇප ලේඛනය පවත්වාගත යුතු වේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 454(2) ප්‍රකාරව විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් පසුගිය වර්ෂ 08කට අධික කාලයක සිට යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | පවත්වා ගෙනයාමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 454(2) හි සඳහන් කර ඇති පරිදි රජයේ ගොඩනැගිලිවල පවතින සියලුම විදුලි උපකරණ සම්බන්ධයෙන් භාණ්ඩ ලේඛනයක් පවත්වාගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 110 ආකෘතියට අනුකූලව හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | ගබඩා සුභසාධක ශාඛාව විසින් යාවත්කාලීනව පවත්වා ගනු ලබයි. | මුදල් රෙගුලාසි 110හි දක්වා ඇති ආකෘතියට අනුකූලව හානි පිළිබඳ ලේඛනය පවත්වා ගත යුතුවේ. |
| (ඈ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පසුගිය වර්ෂ 08කට අධික කාලයක සිට යාවත්කාලීනව පවත්වා නොතිබුණි. | ප්‍රසම්පාදන අංශය විසින් පැමිණීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගනු ලබයි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතුවේ. |
| (ඉ) | අලංසු කැඳවීමේ ලේඛනයක් පසුගිය වර්ෂ 08කට අධික කාලයක සිට යාවත්කාලීනව පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ප්‍රසම්පාදන අංශය විසින් ලංසු කැඳවීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගනු ලබයි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් ලංසු කැඳවීමේ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතුවේ. |

### 1.6.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් නැවත පදිංචි කිරීමේ ප්‍රදේශ එළිපෙහෙළි කිරීමේ වැඩසටහනක් සඳහා රු.4,426,983ක් වැයකර තිබුණ ද, එම ගෙවීම්වල නිවැරදිතාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ලියවිලි ඉදිරිපත් කර නොතිබුණි. | ගෙවීම් වවුචර් සමග මූලික ලියවිලි අමුණා තිබුණ ද, ඇතැම් ලියවිලි අමුණා නොතිබුණි. දැනට මෙම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගනිමින් පවතී. | ගෙවීම් වවුචර් සමග තහවුරු කිරීමේ ලේඛන ඉදිරිපත් කළ යුතුවේ. |
| (ආ) | ගෙවීම් තහවුරු කිරීමට අවශ්‍ය ලියවිලි රහිතව යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවීම් වවුචර් 56ක් සඳහා රු.12,370,862ක් ගෙවා තිබුණි. | තහවුරු කළ හැකි ලේඛනවල පිටපත් මේ සමග අමුණා ඇත. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භාණ්ඩාගාර අග්‍රිම රු.136,775,045ක් නොලද බැවින් පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමටත්, සැලසුම් කළ ව්‍යාපෘති නිම කිරීමටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නොහැකි වී තිබුණි. | භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස් කිරීමේ දී කාල ප්‍රමාද සිදු වූ බැවින් සම්පූර්ණ මුදලම ලබාගත නොහැකි විය. | වැඩි අවශ්‍යතාවක් පවතින කාර්යයන් සඳහා ප්‍රමුඛතාව ලබා දෙමින් කටයුතු කිරීම. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වැය විෂයයන් 05ක් සඳහා රු.6,880,000ක් වෙනත් වැය විෂයන්වලින් මාරු කර තිබුණි. එ ලෙස මාරු කළ මුදල ඒ ඒ වැය විෂයයන්ගේ මූලික ප්‍රතිපාදනයෙන් සියයට 10ත් 58ත් අතර පරාසයක විය. | කොවිඩ් වසංගත තත්ත්වය මත ඇතැම් වැය විෂයයන් ඵලදායි ලෙස පාලනය කිරිම නිසා ඇති වූ ඉතිරි වීම් අවශ්‍යතාව මත වෙනත් වැය විෂයයන්ට මාරු කරන ලදී. | වැය ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම් කිරීම. |

## 2.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු 10ක් විසින් සමාලෝචිත වර්ෂයේ සලසා තිබුණු මූලධන ප්‍රතිපාදන, යෝජිත පරිදි උපයෝජනය නොකිරීම නිසා එම ප්‍රතිපාදනවලින් රු.184,701,364ක් එනම්, සියයට 6ත් 85ත් අතර පරාසයක ඉතිරි වීම් පැවතිණි. | භාණ්ඩාගාරයෙන් අග්‍රිම නිදහස් කිරීමේදී සිදු වූ ප්‍රමාද වීම් සහ ඇතැම් අමාත්‍යාංශ විසින් ප්‍රතිපාදන නිදහස් කිරීම වර්ෂය අවසානයේ සිදු කිරිම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කරගත නොහැකි විය. | මූලධන වියදම් නිසි පරිදි ඇස්තමේන්තු කිරීම හා ප්‍රතිපාදන ඵලදායි ලෙස උපයෝජනය කිරීම. |

## 2.4 නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| (i) | මුදල් රෙගුලාසි අංක 113 | 2,076,809 | හානි ලේඛනයේ පැවැති වර්ෂ 19 ක සිට 33 දක්වා පැරණි ශේෂ ලියා හැරීමට ඇති හැකියාව සලකා බලා නොතිබුණි. | මූලා චක්‍රලේඛ අංක 01/2020 අනුව අවශා අනුමැතිය ලද පසු නිරවුල් කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 113 පරිදි කටයුතු කිරිම. |
| (ii) | මුදල් රෙගුලාසි අංක 137, 138 හා 237 අ (i) | 8,615,147 | යාපනය සහ තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගෙවීම් කිරීමේදී, තහවුරු කිරීමේ ලියවිලි ඉදිරිපත් නොකළ ගෙවීම් වවුචර් ද සහතික කර තිබුණි. | වර්තමානයේ ආධාරක ලියවිලි අමුණා නිවැරදි කර ඇත. පිටපත් අමුණා ඇත. | මුදල් රෙගුලාසි 137, 138 හා 237 අ (i) අනුව කටයුතු කිරිම. |
| (iii) | මුදල් රෙගුලාසි 137 හා 138 | 23,062,785 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් විසින් භාණ්ඩ හා සේවා ලබාගැනීමට පෙර චෙක්පත් 64 ක් ලියා කාර්යාලයේ රඳවා ගෙන තිබුණි. | සැපයූ භාණ්ඩ දෝෂ සහිත වූයෙන් ඒ වෙනුවට නැවත භාණ්ඩ ලැබෙන තෙක් සහ සමහර භාණ්ඩ සැපයීම ප්‍රමාද වීමත් නිසා චෙක්පත් රඳවා ගැනීමට සිදු විය. චෙක්පත් 10ක් පමණක් නිරවුල් කිරීමට ඉතිරිව පවතී. | මුදල් රෙගුලාසි 137 හා 138 ප්‍රකාරව අනුව කටයුතු කිරිම. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි අංක 260(1), (2) | 118,899 | යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ආදායකයාට හෝ ඔහුගේ නීතිමය නියෝජිතයාට හෝ ගෙවීම් සිදුනොකර එම කාර්යාලයේ ගණකාධිකාරී වෙත චෙක්පත් ලියා තිබුණි. | සාමාන්‍ය ක්‍රියාවලිය උල්ලංඝනය කරමින් මෙම කාර්ය සිදු කළ නිලධාරීන්ගෙන් පැහැදිලි කිරීම් ලබා ගන්නා ලදී. | මුදල් රෙගුලාසි 260(1), (2) ප්‍රකාරව කටයුතු කිරිම. |
| (v) | මුදල් රෙගුලාසි අංක 386(5) | 16,204,512 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක් විසින් විවිධ ගෙවීම් සඳහා චෙක්පත් නිකුත් කළ ලෙස දක්වා ඒවා අත රඳවා ගෙන තිබුණි. | මූලික ලියවිලි ලද නමුත් ආධාරක ලියවිලි ද ලැබෙන තෙක් චෙක්පත්වල අත්සන් තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි 386(5) ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | අංක 08/2019 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය | 250,000 | ඩෙල්ෆ් දකුණ සහ යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සංග්‍රහ වියදම් මාසික දීමනා ලෙස වැටුපට එකතු කර ලබා දී තිබුණි. | වර්තමානයේ සංග්‍රහ ගෙවීම් වවුචර් මගින් ප්‍රතිපූර්ණය කිරීමට උපදෙස් ලබා දී ඇත. | අදාළ චක්‍රලේඛය පරිදි කටයුතු කිරීම. |

## 2.5 අවිධිමත් ගනුදෙනු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අනුමත නොකළ ගනුදෙනු

---------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------- | නිර්දේශය<br>--------------- |
|---|---|---|
| මුදල් රෙගුලාසි 137ට පටහැනිව, අනුමත නොකළ රු. 18,236,564ක ගෙවීම් වවුචර් සඳහා මුදල් ගෙවීමට යාපනය සහ වලිකාමම් බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල කටයුතු කර තිබුණි. | මෙය නිවැරදි කළ අතර එහි පිටපත් මේ සමග අමුණා ඇත. | මුදල් රෙගුලාසි 137ට අනුකූලව කටයුතු කළ යුතුවේ. |

(ආ) සහතික නොකළ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් රෙගුලාසි 138 හා 257 ට පටහැනිව, සහතික නොකළ රු.15,383,662ක ගෙවීම් වවුචර් සඳහා ගෙවීම් කිරීමට යාපනය සහ වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල පියවර ගෙන තිබුණි. | අසාමාන්‍ය කාලගුණික තත්ත්වය සහ කොවිඩ් වසංගතය තත්ත්වය හේතුවෙන් ආධාරක ලියවිලි ඉදිරිපත් කිරීමේ යම් කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි. වර්තමානයේ මෙම කරුණ නිවැරදි කර ඇත. | මුදල් රෙගුලාසි 138 සහ 257ට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

## 2.6 වංචනික ස්වරූපයේ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 56 දෙනෙකුට රු.5,000 බැගින් ලබා දුන් බවට කරුණු දක්වා සිදුකළ රු.280,000ක මූල්‍ය වංචාව සම්බන්ධයෙන් විමර්ශන පවත්වා නොතිබුණි. | සමෘද්ධි සංවර්ධන නිලධාරීගේ රාජකාරිය අත්හිටුවා ඇති අතර අනෙකුත් සම්බන්ධිත නිලධාරීන්ට අවවාද සහිත ස්ථාන මාරුවීම් ලබා දී ඇත. අදාළ මුදල් නියමිත නිලධාරීන්ගෙන් අයකර ගැනීමට එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පියවර ගනිමින් පවතී. | වංචා වැළැක්වෙන පරිදි සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රමවේද ඇති කළ යුතු වේ. |

## 2.7 රජයේ නිලධාරීන් සඳහා වූ අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම අනුව, විශ්‍රාම ගිය, මිය ගිය සහ සේවය අත්හිටවූ, නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට මාස 03 සිට වර්ෂ 02ක් දක්වා කාලයක් හිඟ හිටිව පැවැති රු.708,549ක් අයකර ගැනීමට ආයතන සංග්‍රහයේ XXIV පරිශිෂ්ඨයේ 4 වගන්තිය අනුව කටයුතු කර නොතිබුණි | එක් හිඟහිටි ශේෂයක් ඇපකරුගෙන් මාසිකව අය කෙරේ. | හිඟහිටි ශේෂ නොපමාව අයකර ගැනීම. |

**2.8** **තැන්පතු**

---------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් වෙත විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලද රු. 486,989ක් වර්ෂ 02කට වැඩි කාලයක සිට තැන්පත් ගිණුමේ පවතී. අදාළ ව්‍යාපෘති නිම වී නම් එම මුදල් ආපසු යැවීමට හෝ ආදායමට බැර කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. එමෙන්ම, එක් ව්‍යාපෘතියක් සඳහා ලද රු. 13,458,697ක් නිසි උපයෝජනයක් නොමැතිව වර්ෂ 03කට වැඩි කාලයක සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ තැන්පතු ගිණුමේ රඳවා තිබුණි. | මෙම තැන්පතු නොපමාව නිරවුල් කිරීමට පියවර ගෙන ඇත. | අදාළ තැන්පතු ශේෂ නොපමාව නිරවුල් කිරීමට පියවර ගැනීම. |
| (ආ) | ඉදි කිරීම් නිම කළ කොන්ත්‍රාත් වෙනුවෙන් ආපසු ගෙවිය යුතු රු. 2,206,004ක කොන්ත්‍රාත් රඳවුම් මුදල් වර්ෂ 02කට වැඩි කාලයක සිට මුදල් රෙගුලාසි 571ට අනුකූලව නිරවුල් කිරීමට කටයුතු නොකර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක තැන්පතු ගිණුම්වල රඳවා තිබුණි. | මෙම තැන්පතුවලින් රු.550,937ක තැන්පතු නිරවුල් කර ඇත. අනෙකුත් තැන්පතු නිරවුල් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි 571ට අනුකූලව එළදායි ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**2.9** **බැංකු ගිණුම් මෙහෙයවීම**

--------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාස 06කට වඩා කල්ඉකුත් වූ නමුත් ගෙවීම් සඳහා බැංකුව වෙත ඉදිරිපත් නොකළ රු.5,891,523ක චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 391 හා 396 පරිදි කටයුතු කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02ක් විසින් පියවර ගෙන නොතිබුණි. | මූලධන කාර්යයන්හි වැඩ කොටස් නිම නොවීම නිසා චෙක්පත් ලබා දී නොතිබුණි. වැඩ නිම වූ පසු චෙක්පත් නිකුත් කෙරේ. | මුදල් රෙගුලාසි 391 සහ 396ට අනුකූලව කටයුතු කළ යුතු වේ. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා කර්මාන්ත ශාලා 50ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ නල්ලූර් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වූ යෝගට් නිෂ්පාදන ආයතනයක් වෙත ලබා දුන් රු.1,336,300කට මිල දී ගත් යන්ත්‍රය (Batch Pasteurizer) වර්ෂයකට අධික කාලයක සිට අක්‍රීයව පැවැතුණි. | මෙම යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රධාන අමතර කොටස් අදාළ සැපයුම්කරු විසින් මේ දක්වා සපයා නොමැති නිසා එය අක්‍රීය තත්ත්වයේ පවතී. එම අමතර කොටස් ලද වහාම එම යන්ත්‍රය යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රධාන අමතර කොටස් නොමැති යන්ත්‍රයක් මිල දී ගැනීම සම්බන්ධයෙන් විමර්ශනයක් කළ යුතු වීම. |
| (ආ) | ධීවර පවුල් වෙත ලබා දීම සඳහා 2017 වර්ෂයේදී ලද රු.690,849ක් වටිනා දැල් 152ක් වර්ෂ 03ක කාලයක සිට වඩමාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තිබුණි. | මෙම දැල් ගැඹුරු මුහුදේ මාළු ඇල්ලීම සඳහා සුදුසු බව දන්වන ලදී. මේ නිසා එම දැල් අවශ්‍ය ප්‍රතිලාභීන් වෙත ලබාදීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කටයුතු කරමින් පවතී. | මිල දී ගැනීමට පෙර අවශ්‍යතාව හොඳින් හඳුනාගතයුතු වීම හා නිෂ්කාර්ය වත්කම් ඵලදායි ලෙස භාවිතා කිරීම. |

3.2 ව්‍යාපෘති නිමකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යාපනය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 11ක්, නියමිත කාලය තුළ අවසන් කර නොතිබුණි. එහෙත්, එම කාල ප්‍රමාදය සඳහා රු. 1,260,469ක් වූ ප්‍රමාද ගාස්තු එළැඹුණු ගිවිසුම පරිදි අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය, කාලගුණික වෙනස් වීම් මත පොළොව අභ්‍යන්තර ජල මට්ටම අඩු වීමට කල්ගත වීම වැනි හේතු නිසා නියමිත කාලය තුළ සමහර ව්‍යාපෘති අවසන් කිරීමට නොහැකි වී තිබුණි. එසේ වුවත්, කොන්ත්‍රාත් රඳවා ගැනීමේ මුදලින් හෝ සෘජුව මෙම මුදල් ගෙවන ලෙස හෝ අදාළ කොන්ත්‍රාත්කරු වෙත දන්වා යවා තිබුණි. එමෙන්ම, දක්වා ඇති ප්‍රමාද | ව්‍යාපෘති නියමිත කාලය තුළ ඉටුකර ගැනීමටත්, කාර්යයන් ප්‍රමාදවන අවස්ථාවල දී ගිවිසුම් ප්‍රකාර අදාළ ප්‍රමාද ගාස්තු අය කිරීමටත් පියවර ගැනීම. |

| | | | |
|---|---|---|---|
| | | ගාස්තුවලින් යම් මුදලක් අයකර ගැනීමට ද පියවර ගෙන ඇත. | |
| (ආ) | රුක් රෝපණය කිරීමේ ජාතික වැඩසටහන වෙනුවෙන් 2019 නොවැම්බර් මාසයේදී පැල ලබා ගැනීමේ අරමුණින් බීජ තවාන් කිරීම සඳහා තෙන්මාරච්චි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.425,626ක් ගෙවා තිබුණි. එහෙත්, මාස 15ක් ගත වී තිබුණ ද, 2021 මාර්තු මාසය දක්වාම එම පැල ලැබී නොතිබුණි. | ප්‍රදේශ හුදෙකලා කිරීම, කාලගුණික වෙනස්වීම් වැනි හේතු නිසා නියමිත කාලය තුළ මෙම ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වී තිබුණි. ඉතා ඉක්මනින් නිවැරදි කිරීමට කටයුතු කර කෙරේ. | වැඩසටහන් නියමිත කාලය තුළ නිම කිරීමට අවධානය යොමු කිරීම හා සැලසුම් සාර්ථකව නිම කිරීමට ප්‍රසස්ත ක්‍රියාමාර්ග ගැනීම. |
| (ඇ) | කුඩා කර්මාන්ත ශාලා 50ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන, යටතේ ව්‍යාපෘති 03ක් වෙනුවෙන් රු.30,388,000ක් ගෙවා තිබුණ ද, ඒ කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අවශ්‍ය පළපුරුදුකම නොමැති වීම නිසා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි වී තිබුණි. ලද මුදල් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ නිසා මූල්‍යමය පාඩුවක් සිදු නොවූ බව දන්වමි. | ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට පෙර අවශ්‍ය මානව සම්පත් පිළිබඳ ඇගයීමක් සිදුකළ යුතු වේ. |
| (ඈ) | ඉදි කිරීම් කාර්යයන් ඉටු කිරීමට තරම් ප්‍රමාණවත් භෞතික හා මානව සම්පත්වලින් ග්‍රාමීය සංවිධාන පරිපූර්ණ ද යන්න පිළිබඳ නිසි ඇගයීමක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකර නොතිබුණි. උදාහරණයක් ලෙස, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් විසින් ග්‍රාමීය සංවිධාන 06කට රු.11,249,000ක කොන්ත්‍රාත් ලබා දී තිබුණ ද, 2020 දෙසැම්බර් 31 දින දක්වාම ඇස්තමේන්තුව අනුව එම කාර්යයන් අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ පළපුරුද්ද, හැකියාව ආදිය තහවුරු කර ගෙන තිබුණි. එහෙත්, නොවැළැක්විය හැකි හේතු සහ වැඩ නිම කිරීමට ප්‍රමාණවත් කාලයක් නොලැබීම නිසා මෙම කොන්ත්‍රාත් නියමිත කාලය තුළ අවසන් කළ නොහැකි වී තිබුණි. වර්තමානයේ මෙය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | කොන්ත්‍රාත් පිරිනැමීමට ප්‍රථම අවශ්‍ය භෞතික සහ මානව සම්පත් කොන්ත්‍රාත්කරු සතුව පවතීද යන්න තහවුරු කළ යුතු අතර ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | කුඩා කර්මාන්ත ශාලා 50ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති 04ක කාර්යයන් වර්ෂයකට වඩා කල්ගත වී තිබුණ ද, අවසන් කර නොතිබුණි. මේ නිසා එම කොන්ත්‍රාත් සඳහා වූ කාර්යසාධන බැඳුම්කර 05ක එකතුව රු.3,756,250ක් රජයේ ආදායමට බැර කිරීමට ඇති හැකියාව පිළිබඳ සලකා බලා නොතිබුණි. | මේ සඳහා වූ සනාථ කිරීමේ ලේඛන මේ සමග අමුණා ඇත. | ඇප බැඳුම්කර මුදල්වලට මාරුකර රජයේ ආදායමට මාරු කිරීමට නියමිත කාලය තුළ කටයුතු කළ යුතුවේ. |

**3.3 රජයේ නිලධාරීන් ඇප තැබීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04ක සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් 04දෙනෙකු විසින් මුදල් රෙගුලාසි 880ට පටහැනිව, ඇප තැන්පත් කර නොතිබීම හෝ අඩුවෙන් ඇප තැන්පත් කර තිබීම. | අඩුවෙන් ඇප තබා ඇති සහ ඇප තබා නොමැති නිලධාරීන් නියමිත ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කර ඇත. ඇප තැන්පත් ප්‍රමාද කරන නිලධාරීන්ට මුදල් රෙගුලාසි 880 හා 881 පරිදි කටයුතු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 880 හි සඳහන් විධිවිධාන අනුව ඇප තැබීමට කටයුතු කළ යුතුවේ. |

**3.4 පාඩු හා හානි**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වඩමාරච්චි නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කළ සපිරි ගමක් වැඩසටහන යටතේ එක් ඉදි කිරීමක් සඳහා රු.58,270ක වැඩිපුර ගෙවීමක් සිදුකර තිබුණි. | අදාළ මුදල් අයකර මෙම ව්‍යාපෘතිය නිම කිරීමට කෘෂි සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාමාර්ග ගෙන ඇත. | වැඩිපුර කළ ගෙවීම අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | චුන්නාගම් තැපැල් කාර්යාලය සහ තැපැල් ස්ථානාධිපති නිල නිවාසය ඉදි කිරීමේ ඇස්තමේන්තුගත පිරිවැය රු.16,881,625ක් විය. මේ සඳහා අවම මිල ගණන් ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුම ගිවිසුම් කොන්දේසි සඳහා එකඟ වී නොතිබුණි. පසුව නැවත ප්‍රසම්පාදනයක් සිදුකිරීම වෙනුවට තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් නිර්දේශ නොකළ ලංසුකරුවෙකුට ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. ඔහු විසින් එම කාර්යයන් නිම නොකිරීම නිසා ඉටුකළ කාර්යයන්ට පමණක් ගෙවීමේ පදනම යටතේ 2019 දෙසැම්බර් 31 දින දෙපාර්ශවයේ එකඟතාවෙන් ගිවිසුම අවසන් කර තිබුණි. පහත කරුණු නිරීක්ෂණය කෙරේ. | ලද ප්‍රතිපාදන ආපසු යැවීමට සිදු වීම, පොදු සුභසාධන කාර්යයක් ඉටු නොවීම, නව ප්‍රසම්පාදනයක් සඳහා කාලය ප්‍රමාණවත් නොවීම වැනි කාරණා හේතුවෙන් අවම මිල ගණන් ඉදිරිපත් කළ ලංසුකරුවෙකුට කොන්ත්‍රාත්තුව පිරිනමන ලදී. දෙපාර්ශවයේ එකඟතාවෙන් 2019 දෙසැම්බර් 31 දින කොන්ත්‍රාත්තුව අවසන් කළ බැවින් කාර්යසාධන | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පරිදි කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම, ගිවිසුම් පරිදි ප්‍රමාද දඩ මුදල් අය කිරීම, කොන්ත්‍රාත්කරු තෝරා ගැනීමේදී ඔවුන්ගේ පළපුරුද්ද හා හැකියාව පිළිබඳ ඇගයීමක් කිරීම සිදුකළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (i) | ගිවිසුම පරිදි ව්‍යාපෘතිය අවසාන නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු විසින් ගෙවිය යුතු වන රු. 1,668,162ක ප්‍රමාද ගාස්තු අයකර ගැනීමටත්, රු. 845,000ක් වූ කාර්යසාධන ඇපකරය රඳවා ගැනීමටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි. | ඇපකරය මාරු කිරීමට අවශ්‍යතාවක් නොවීය. ඒ වන විට ඉටු කළ වැඩ වෙනුවෙන් පමණක් ගෙවීම් සිදුකර තිබුණි. | |
| (ii) | ගිවිසුමේ කොන්ත්‍රාත් දත්ත (Contract Data) 60.1 අනුව, සහතික කළ වැඩ සඳහා ගෙවීම් කිරීමේදී නොකළ වැඩවලින් සියයට 25ක් එනම්, රු. 1,169,074ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි. | දෙපාර්ශවයේ එකඟතාවෙන් ගිවිසුම අවසන් කළ බැවින් මෙම මුදල අයකර නොතිබුණි. | දෙපාර්ශවයේ එකඟතාව විගණනයේදී අපැහැදිලි විය. කොන්ත්‍රාත් දත්ත 60.1 අනුව, අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ඩෙල්ෆ් උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයකට සිදු වූ හානියෙන් කොටසක් ප්‍රතිපූරණය කර තිබුණි. එහෙත්, ප්‍රතිපූරණය කරගත නොහැකි වූ රු. 494,096ක හානිය පිළිබඳ අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කරමින් පවතී. | මුදල් රෙගුලාසි 104 සිට 110 දක්වා වූ විධිවිධාන පිළිපැදීම, ප්‍රතිපූරණය කරගත නොහැකි මුදල සඳහා වගකීම නිශ්චය කිරීම හා ඉතිරි අලාභ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කළ යුතුවේ. |

### 3.5 මෙහෙයුම් දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05ක් මගින් නිකුත් කළ චෙක්පත්, ආදායකයා වෙත භාරදීම වෙනුවට චෙක්පත් හා සම්බන්ධ විෂයභාර නිලධාරීන් විසින් එම චෙක්පත් භාරගෙන තිබුණි. | කඩිනමින් ආදායකයාට චෙක්පත් ලබා දීමේ අරමුණින් විෂයභාර නිලධාරීන් විසින් චෙක්පත් භාර ගෙන තිබුණි. | ආදායකයා වෙත චෙක්පත් භාරදීමට කටයුතු කළ යුතුවේ. |

| | | |
|---|---|---|
| (ආ) යාපනය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සිදු කළ රු.448,723ක් මුදලින් කළ ගෙවීම්, චෙක්පතක් මුදල් කර ගණකාධිකාරී විසින් පුද්ගලිකව ආදායකයින් වෙත මුදල් ගෙවා තිබුණු අතර ඒවා සරප්ගේ ගෙවීම් ලේඛනයට ද ඇතුළත් කර නොතිබුණි. | අතපසු වීමකින් ලේඛනගත කර නොතිබුණ ද, පසුව මෙය නිවැරදි කර ඇත. | මුදලින් ගෙවීම්, එම ලේඛනයේ සටහන් කිරීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව 1447ක් වූ අතර පුරප්පාඩු 194ක් සහ අතිරික්ත තනතුරු 04ක් පැවැතුණි. | පිළිගනිමි.<br>අතිරික්ත නිලධාරීන් සිව්දෙනාගෙන් දෙදෙනෙකු "සේවයේ සිටින තුරු රාජකාරී ඉටු කිරීම" පදනම යටතේ සේවය කරනු ලැබේ. එක් අයෙකු සඳහා 2021 වර්ෂයේ ස්ථාන මාරු වීම් ලැබී ඇත. ඉතිරි නිලධාරියා සඳහා සේවක සංඛ්‍යාව අනුමත කර දෙන ලෙස මුදල් රෙගුලාසි 71 ප්‍රකාර ඉල්ලීම් කර ඇත. | සේවා අවශ්‍යතා සැලකිල්ලට ගෙන අනුමත සේවක පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමටත්, අතිරික්ත නිලධාරීන් ඵලදායී ලෙස අනුයුක්ත කිරීමටත් පියවර ගැනීම. |